DOI : 10.31357/fhssmph.2014.00731

# පෞරුෂය : - මානුෂවාදී විග්‍රහය පිළිබඳ අධ්‍යයනයක්

# (Personality : - A Study of Humanistic Analysis)

එන්. ඩී ගුනේන්ද්‍ර ගයන්ත

GS/Mphil/PH/3749/09

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනශූරී/දර්ශනය උපාධි පරීක්ෂණය සඳහා

''දර්ශනය හා මනෝවිද්‍යාව'' විෂය යටතේ

ඉදිරිපත් කෙරෙන නිබන්ධය යි.

## අනුක්‍රමිකාව

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය මහාචාර්ය ඥානදාස පෙරේරා ගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නො කරන ලද බවත් සහතික කරමි.

24/07/14.

මෙයට එන්. ඩී ගුනේන්ද්‍ර ගයන්ත

අපේක්ෂක

## උපදේශක ගේ ප්‍රකාශය

මෙම අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බව ත්, මෙම නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

මෙයට මහාචාර්ය ඥානදාස පෙරේරා

උපදේශක

පටුන


1. පළමු වැනි පරිච්ඡේදය

1. 1. හැඳින්වීම 9

1. 2. අරමුණ 10

1. 3. පර්යේෂණ ක්‍රමවේදය 10

1. 4. පර්යේෂණයේ වැදගත්කම 11

2. දෙ වැනි පරිච්ඡේදය

2. පෞරුෂය හැඳින්වීම

2. 1. පෞරුෂය නිර්වචනය කිරීම 12 - 17

2. 1. 1. පෞරුෂ න්‍යායයන්

2. 1. 1. 1. ගතිලක්ෂණ න්‍යාය 17 - 19

2. 1. 1. 2. විලියම් ෂෙල්ඩන් ගේ ගතිලක්ෂණ න්‍යාය 19

2. 1. 1. 3. ජී. ඩබ්ලිව් ඕල්පෝර්ට් ගේ ගතිලක්ෂණ න්‍යාය 19 - 23

2. 1. 1. 4. රේමන්ඩ් බර්නාඩ් කැටෙල් ගේ ගතිලක්ෂණ න්‍යාය 24 - 26

2. 1. 1. 5. හැන්ස් ජුගන් අයිසෙන්ක් ගේ ගතිලක්ෂණ න්‍යාය 26 - 28

2. 1. 1. 6. ලුවිස් ආර් ගෝල්ඩ්සබර්ග්ගේ පස්මහ වැදෑරුම් පෞරුෂ විශ්ලේෂණය 28 - 30

2. 1. 1. 7. මියර්ස් - බ්‍රිග්ස් වර්ග දර්ශකය 30 - 38

2. 1. 1. 2. මනෝවිශ්ලේෂණවාදී සිද්ධාන්තය 38 - 51

2. 1. 1. 3. පෞරුෂය පිළිබඳ සමාජ ඉගෙනුම් න්‍යාය 51 - 54

ආන්තික සටහන් 54 - 58

3. තෙ වැනි පරිච්ඡේදය

3. 1. මානුෂවාදය පිළිබඳ හැඳින්වීම 59 - 62

3. 1. 1. මානුෂවාදයෙහි ඓතිහාසික සංවර්ධනය 62

3. 1. 2. ආදි ග්‍රීක යුගයෙහි මානුෂවාදී දාර්ශනික ආකල්ප 63

3. 1. 3. සම්භාව්‍ය දාර්ශනික යුගයෙහි මානුෂවාදී ආකල්ප 64

3. 1. 4. බුද්ධි ප්‍රබෝධයෙහි මානුෂවාදී දාර්ශනික ආකල්ප 64 - 66

3. 1. 5. උපයෝගිතවාදී චින්තකයින්ගේ මානුෂවාදී ආකල්ප 66 - 68

3. 1. 6. සමකාලීන යුගයේ මානුෂවාදී දාර්ශනික ආකල්ප 68 - 71

3. 1. 7. පරිණාමවාදීන්ගේ මානුෂවාදී දාර්ශනික ආකල්ප 71 - 72

3. 2. මානුෂවාදයෙහි චර්යාධර්ම (ශික්ෂාව) 72 - 77

3. 3. මානුෂවාදී දර්ශනයෙහි වර්ගීකරණය 77

3. 3. 1. දාර්ශනික මානුෂවාදය (Philosophical Humanism) 77 - 78

3. 3. 1. 1. නූතන මානුෂවාදය (Modern Humanism) 79

3. 3. 1. 2. ක්‍රිස්තියානි මානුෂවාදය (Christian Humanism) 79 - 83

3. 3. 2. සංස්කෘතික මානුෂවාදය - (Cultural Humanism) 84

3. 3. 3. සාහිත්‍යමය මානුෂවාදය Literary Humanism 84 - 85

3. 3. 4. පුනරුද මානුෂවාදය (Renaissance Humanism) 85 - 88

3. 3. 5. ආගමික මානුෂවාදය (Religious humanism) 88 - 89

ආන්තික සටහන් 90 - 93

4. සිව් වැනි පරිච්ඡේදය


| | |
|---|---|
| **4. 1. මානුෂවාදී මනෝවිද්‍යාවෙහි ආරම්භය හා විකාශය** | 94 |
| 4. 1. 1. ඓතිහාසික සන්දර්භය | 94 - 97 |
| 4. 1. 2. මානුෂවාදී මනෝවිද්‍යාවෙහි ආරම්භය | 98 - 101 |
| 4. 1. 3. මානුෂවාදී මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි සංවර්ධනය | 102 - 104 |
| 4. 1. 4. මානුෂවාදී උපදේශනය සහ මනෝප්‍රතිකාරය | 105 |
| 4. 1. 4. 1. පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශය | 105 - 108 |
| 4. 1. 4. 2. මානුෂවාදී උපදේශනයෙහි සහ මනෝප්‍රතිකාරයෙහි ක්‍රියාවලිය | 109 - 110 |
| 4. 1. 5. මානුෂවාදී මනෝවිද්‍යාවෙහි වෙනත් භාවිතයන් | 111 - 115 |
| ආන්තික සටහන් | 115 - 117 |


5. පස් වැනි පරිච්ඡේදය


| | |
|---|---|
| 5. 1. ඒබ්‍රහම් මාස්ලෝගේ මානුෂවාදී පෞරුෂ විග්‍රහය. | 118 |
| 5. 2. ඒබ්‍රහම් හැරල්ඩ් මාස්ලෝ හැඳින්වීම. | 118 - 122 |
| 5. 3. ඒබ්‍රහම් මාස්ලෝගේ අවශ්‍යතා ධුරාවලිය | 123 - 129 |
| 5. 4. ආත්ම - සාක්ෂාත්කරණය | 129 - 134 |
| 5. 5. ඒබ්‍රහම් මාස්ලෝ විසින් ඉදිරිපත් කොට ඇති භාව අගයන පද්ධතිය (සත්චාරිත්‍ර මූලධර්ම පද්ධතිය) (B – Values) | 134 - 137 |
| ආන්තික සටහන් | 137 - 138 |


6. සය වැනි පරිච්ඡේදය

**6. කාල් රොජර්ස්ගේ පෞරුෂ විග්‍රහය.**


| | |
|---|---|
| 6. 1. කාල් රොජර්ස් හැඳින්වීම. | 139 - 142 |
| 6. 2. කාල් රොජර්ස්ගේ පෞරුෂ සංකල්පයෙහි පසුබිම | 142 - 145 |
| 6. 3. කාල් රොජර්ස්ගේ පෞරුෂ සංවර්ධන න්‍යාය | 146 - 153 |
| ආන්තික සටහන් | 153 - 154 |

7. සත් වැනි පරිච්ඡේදය

7. මානුෂවාදී මනෝවිද්‍යාවේ පුද්ගල පෞරුෂය සම්බන්ධයෙන්

ඉදිරිපත්වන නව ප්‍රවණතා

7. 1. ධනාත්මක මනෝවිද්‍යාව 155

7. 2. ධනාත්මක මනෝවිද්‍යාවේ ඓතිහාසික සංවර්ධනය 156 - 158

7. 3. ධනාත්මක මනෝවිද්‍යාමේ මූලික අංශ තුන 159

7. 3. 1. ධනාත්මක චිත්තවේග 159

7. 3. 2. ධනාත්මක පුද්ගල ගතිලක්ෂණ 160 - 162

7. 3. 3. ධනාත්මක ආයතන 163 - 164

7. 5. අව්‍යාජ සතුට පිළිබඳ සිද්ධාන්තය 165 - 166

7. 6. ධනාත්මක මනෝවිද්‍යාවේ භාවිතය 166

7. 2. පුද්ගලාතික්‍රමණ මනෝවිද්‍යාව 167 - 168

7. 2. 1. පුද්ගලාතික්‍රමණ මනෝවිද්‍යාව නිර්වචනය කිරීම 168 - 170

7. 2. 2. පුද්ගලාතික්‍රමණ මනෝවිද්‍යාව හා සම්බන්ධ විෂය ක්ෂේත්‍රයන් 170 - 172

ආන්තික සටහන් 172 - 173

8 අට වැනි පරිච්ඡේදය

8. සමාලෝචනය හා නිගමනය 174 - 177

9. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 178 - 189

9. පාරිභාෂික ශබ්ධ මාලාව 190 - 221

10. උපග්‍රන්ථය


උප ග්‍රන්ථය - I 222- 223

උප ග්‍රන්ථය - II 224 - 226

උප ග්‍රන්ථය - III 227 - 229

උප ග්‍රන්ථය - IV 230 - 232

උප ග්‍රන්ථය - V 233

උප ග්‍රන්ථය - VI 234 - 235

උපකාරානුස්මෘතිය

දර්ශනශූරී උපාධි පරීක්ෂණය සඳහා මෙම නිබන්ධය සකස් කිරීමෙහි දී මා පැමිණි ගමන් මගෙහි කෘතඥතාපූර්වකව සිහිපත් කළ යුතු කරුණු කිහිපයක් පවතී. එනම්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනය හා මනෝවිද්‍යාව පිළිබඳ නිබන්ධක තනතුර සඳහා මා බඳවා ගත් පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති ධුරය හෙබවූ මහාචාර්ය නායිම්බල ධම්මදස්සී හිමියන්ට සහ තත් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය කේන්ද්‍රීයව ශිෂ්‍යයින්ට පියකුමෙන් ක්‍රියා කරන මාගේ මෙම පර්යේෂණ නිබන්ධයේ උපදේශක දර්ශනය හා මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ඥානදාස පෙරේරා මහතාට පළමුව කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනැමිය යුතුය.

කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අංශයේ හිටපු අංශාධිපති ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික මහාචාර්ය දයා එදිරිසිංහ මැතිතුමන් නිරන්තරයෙන් මේ සඳහා මා දිරිමත් කරමින් දෙන ඔවදන් අගය කරමින් එතුමන්ට ද මාගේ කෘතඥතාපූර්වක ස්තුතිය පිරිනමමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අංශයේ වත්මන් අංශාධිපති ධුරය හොබවන ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමියන් ද මෙ වැනි පර්යේෂණ කිරීම සඳහා ලබා දෙන දිරිමත් කිරීම් අගය කරමින් කෘතවේදීව සිහිපත් කරමි.

තත් විශ්වවිද්‍යාලයේ ම මාගේ ගුරුභවතුන් වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. ඒ වීරසේන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය යාපරත්න වීරසේකර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අරුණ ශාන්ත වල්පොල, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජී. ඒ ගාමිණී රත්නශ්‍රී, ජෙෂ්ඨ කථිකාචාර්ය එලමල්දෙනියේ සාරානන්ද හිමි, ජෙෂ්ඨ කථිකාචාර්ය කුඹුකේ චන්ද්‍රාලෝක හිමි, ආචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි, මැදගම්පිටියේ විජිතධම්ම හිමි, ජ්‍යෙෂ්ඨ කථිකාචර්ය දුනේෂ් ඉන්ද්‍රරත්න මහතා සහ කල්‍යාණ මිත්‍ර නිබන්ධ උපදේශක නෙල්ලිවල මෙත්තානන්ද හිමියන් ප්‍රමුඛ හිමිවරුන් ද කෘතවේදීව සිහිපත් කරමි. මාගේ සහෝදරයෙකු මෙන් මාව දිරිමත් කරන කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්දිම බෝගහවත්ත මහතා ද, කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අංශයේ මාගේ සහෝදර ආචාර්ය මණ්ඩලයේ කථිකාචාර්ය පූජ්‍ය කුඹුකන්දන රේවත හිමියන්ට ද, දිලක්ෂි ද සිල්වා මැතිණියට ද, චමිලා සිරිවර්ධන මෙනෙවියට ද, කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනමමි. නිරතුරුව මා වටා සිටිමින් මා හට ආශිර්වාද කරන මාගේ මෑණියන් ද පියාණන්ද කෘතවේදීව මෙහිලා සිහිපත් කරමි.

නිබන්ධ මාතෘකාව :- "පෞරුෂය :- මානුෂවාදී විග්‍රහය පිළිබඳ අධ්‍යයනයක් "

එන්. ඩී. ගුනේන්ද්‍ර ගයන්ත

## නිබන්ධ සාරාංශය


ඉහත මාතෘකාවට අදාළව මෙම පර්යේෂණය සිදු කිරීමේදී මූලික වශයෙන් පෞරුෂය සම්බන්ධයෙන් ඉදිරිපත් වන නිර්වචන පිළිබඳ විමසීමක් සිදු කෙරේ. ඉන් අනතුරුව පෞරුෂ න්‍යායයන් විමසීමට ලක් කෙරේ. මෙම පෞරුෂ න්‍යායයන් යටතේ ගති ලක්ෂණ න්‍යාය සහ එහි අනු කොටස් එනම්, විලියම් ෂෙල්ඩන් ගේ ගතිලක්ෂණ න්‍යාය, ජී. ඩබ්ලිව් ඕල්පෝර්ට් ගේ ගතිලක්ෂණ න්‍යාය, රේමන්ඩ් බර්නාඩ් කැටෙල්ගේ ගතිලක්ෂණ න්‍යාය, හැන්ස් ජුගන් අයිසෙන්ක්ගේ ගතිලක්ෂණ න්‍යාය, ලුවිස් ආර් ගොල්ඩ්ස්බර්ග්ගේ පස්මහ වැදැරුම් පෞරුෂ විශ්ලේෂණය, මියර්ස් බ්‍රිග්ස් වර්ග දර්ශකය පිළිබඳ සෛද්ධාන්තික කරුණු විමසා බැලීමක් සිදු කෙරේ. එසේම, ගති ලක්ෂණ න්‍යායෙන් වෙනත් අංශයන්ට යොමු වූ මනෝවිශ්ලේෂණවාදී න්‍යාය සහ සමාජ ඉගෙනුම් න්‍යාය පිළිබඳ විමසීමක් ද සිදු කෙරේ.

ඉන් අනතුරුව මානුෂවාදී මනෝවිද්‍යාව බිහි වීමෙහිලා ඉවහල් වූ මානුෂවාදී දර්ශනය පිළිබඳ විමර්ශනයක් අන්තර්ගත ය. මේ යටතේ මානුෂවාදී දර්ශනයෙහි ඓතිහාසික සංවර්ධනය පිළිබඳ විමසා බැලීමක් සිදු වේ. ඒ අනුව, ආදි ග්‍රීක යුගයේ දාර්ශනිකයින්, සම්භාව්‍ය දාර්ශනික යුගයේ දාර්ශනිකයින් බුද්ධි ප්‍රබෝධයෙහි, දාර්ශනිකයින්, උපයෝගිතාවාදී දාර්ශනිකයින්, සමකාලීන යුගයේ දාර්ශනිකයින් සහ පරිණාමවාදී දාර්ශනිකයින් ගේ ඉගැන්වීම්වල එන මානුෂවාදී දාර්ශනික ප්‍රවණතා විමසීමට ලක් කෙරේ. එසේම, මානුෂවාදී දර්ශනයෙහි සාකච්ඡා කෙරෙන චර්යා ධර්ම පිළිබඳ විග්‍රහයක් ද මානුෂවාදී දර්ශනයේ වර්ගීකරණයක් ද අන්තර්ගත ය. දාර්ශනික මානුෂවාදය, නූතන මානුෂවාදය, ක්‍රිස්තියානි මානුෂවාදය, සංස්කෘතික මානුෂවාදය, සාහිත්‍යමය මානුෂවාදය, පුනරුද මානුෂවාදය, ආගමික මානුෂවාදය වැනි අංශයන් මෙහිදී සාකච්ඡා කෙරේ.

මානුෂවාදී මනෝවිද්‍යාවෙහි ආරම්භය හා විකාශනය සිදු වූ අකාරය ත් විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනය සිදු වූ ආකාරයත් විමසා බැලීම අනතුරුව සිදු කෙරෙන අතර පුද්ගල පෞරුෂ

සංවර්ධනයට හේතු වූ මානුෂවාදී උපදේශනය හා මනෝප්‍රතිකාරය භාවිතයට ගත් ආකාරය විමසා බලනු ලැබේ. පසුකාලීනව මානුෂවාදී මනෝවිද්‍යාව අධ්‍යාපනය වැනි වෙනත් අංශයන් තුළ භාවිතයට ගැනුණ ආකාරය පිළිබඳව ද මෙහිදී විමසා බැලෙයි.

අනතුරුව ඒබ්‍රහම් මාස්ලෝ විසින් ඉදිරිපත් කරන ලද පෞරුෂ න්‍යායයන් පිළිබඳව විමසීමක් සිදු කෙරෙයි. මානුෂවාදී මනෝවිද්‍යාවේ පුරෝගාමියා වන්නේ ඒබ්‍රහම් මාස්ලෝ ය. ඒබ්‍රහම් මාස්ලෝ විසින් ඉදිරිපත් කරන ලද අවශ්‍යතා ධුරාවලිය සහ පසු කාලීනව එහි සිදු කෙරුණ සංශෝධන ද, ආත්ම සාක්සාත්කරණය පිළිබඳව මාස්ලෝ විසින් දක්වන ලද අදහස් ද, ඔහු විසින් ඉදිරිපත් කරන ලද භාව අගයන පද්ධතිය පිළිබඳව ද විමසා බැලීමක් මේ යටතේ සිදු කෙරේ.

කාල් රොජර්ස් මානුෂවාදී මනෝවිද්‍යාවට ඉටු කරන ලද දායකත්වය පිළිබඳව අනතුරුව විමසා බැලෙන අතර උපදේශන අංශය සහ මනෝප්‍රතිකාරාත්මක අංශය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ද කාල් රොජර්ස් විසින් ඉදිරිපත් කරන ලද ස්ව සංකල්පය ප්‍රමුඛ කොට ගත් පෞරුෂ සංවර්ධන න්‍යාය පිළිබඳ විමසා බැලීමක් ද විශේෂයෙන් මේ යටතේ සිදු කෙරේ.

අවසාන වශයෙන් මානුෂවාදී මනෝවිද්‍යාව තුළ පුද්ගල පෞරුෂය සම්බන්ධයෙන් ඉදිරිපත් වන නව ප්‍රවණතා සම්බන්ධයෙන් විමසා බැලෙයි. ඒ අනුව, නව ප්‍රවණතා ලෙස විෂය ක්ෂේත්‍රයන් දෙකක් හමු වේ. එනම් ධනාත්මක මනෝවිද්‍යාව (Positive Psychology) සහ පුද්ගලාතික්‍රමණ මනෝවිද්‍යාව (Transpersonal Psychology) යි. ධනාත්මක මනෝවිද්‍යාව මගින් සාකච්ඡා කෙරෙන්නේ පුද්ගලයෙකුගේ ජීවිතයේ ධනාත්මක අංශයන් පිළිබඳව ය. එනම් ධනාත්මක චිත්තවේග, ධනාත්මක පුද්ගල ගතිලක්ෂණ ආදිය යි. පුද්ගලයෙකුට සතුට ළඟාකර ගැනීම සඳහාත් ධනාත්මක පෞරුෂයක් උරුම කර ගැනීම සඳහාත් ධනාත්මක මනෝවිද්‍යාව ඉවහල් වේ.

පුද්ගලාතික්‍රමණ මනෝවිද්‍යාව මනොවිද්‍යාව යනු මනුෂ්‍යයාගේ පුද්ගලත්වය ඉක්මවා ගිය අධ්‍යාත්මික අංශයන් පිළිබඳව කරණු ලබන අධ්‍යයනයන් ඇතුළත් අංශය කි. මේ තුළ පුද්ගල පෞරුෂය උත්තරීතර තත්ත්වයකට පත්කර ගැනීමෙහිලා වැදගත් කොට සාකච්ඡා කෙරෙන විවිධ අංශයන් පිළිබඳ විමසා බැලීමක් සිදු කෙරෙයි.

ය

# 1. පළමු වැනි පරිච්ඡේදය

## 1.1. හැඳින්වීම

වර්තමානය වන විට මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනයත් සමග ''පෞරුෂ මනෝවිද්‍යාවට අදාළ ව පෞරුෂය යනු කුමක්දැයි විවිධ න්‍යායයන් ඔස්සේ විග්‍රහ වී තිබේ. සරල අර්ථය විමසන කල මිනිසෙකුගේ චරිතය අනික් මිනිසුන්ගේ චරිතයන් හා සසඳන කල වෙනස් වී පෙනෙන විවිධ පැතිකඩ පෞරුෂය වශයෙන් පෙන්වාදිය හැකිය.

මානුෂවාදය යනු ආගමික විශ්වාසයන්ට වඩා බුද්ධිය මත පදනම්ව මිනිසුන්ගේ ගැටලු විසඳීමට සලකා බැලෙන චින්තන ක්‍රමයකි. මිනිසා වටා කේන්ද්‍රගතව මෙම දර්ශනය ගොඩනැගී තිබේ. මිනිසාගේ මූලික ස්වභාවයෙහි වැදගත්කම, වටිනාකම එයින් අවධාරණය කෙරෙයි. මානුෂවාදය මනුෂ්‍ය අභිරුචීන්, වටිනාකම්, සහ ගෞරවය ආරක්ෂා කිරීම උදෙසා ගොඩ නැගුණ දාර්ශනික විෂය ක්ෂේත්‍රයකි. මානුෂවාදය මගින් උපරිම විශ්වාසය තබන්නේ මානව වර්ගයා කෙරෙහි පමණි. මනුෂ්‍යයින්ට සිය ජීවිතයේ මුහුණ දීමට සිදුවන විවිධ ගැටලු විසඳා ගැනීමේ බලය නැතහොත් විභවතාව (potentiality) ඕනෑම මිනිසෙකු හෝ ගැහැණියක සතුව පවතින බව මෙමගින් අවධාරණය කරයි. මිනිසාගේ ධෛර්යය හා විචක්ෂණභාවය මේ සඳහා අත්‍යවශ්‍ය ය. මෙහිලා මානුෂවාදය මගින් විචාරය හා විද්‍යාත්මක ක්‍රමය මත විශ්වාසය තබයි.

එසේ ම මානුෂවාදී මනෝවිද්‍යාවද මිනිසාගේ වටිනාකම අවධාරණය කරන විෂය ක්ෂේත්‍රයකි. කාල් රොජර් සහ ඒබ්‍රහම් මාස්ලෝ වැනි මනෝවිද්‍යාඥයින්ගේද සාංදෘෂ්ටිකවාදීන්ගේ ද ප්‍රපංච විද්‍යාඥයින්ගේද පුරෝගාමීත්වයෙන් විසිවන ශත වර්ෂයෙහි මැද භාගයේ ඉහළට ම නැගි මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකි. එය ජීවිතයක අර්ථය, වටිනාකම්, නිදහස, පුද්ගලික වගකීම, ආධ්‍යාත්මිකතාව සහ ආත්ම සාක්ෂාත්කරණය වැනි මිනිස් පැවැත්මේ සකලවිධ ප්‍රවේශයන් යොදා ගනී.

ඒ අනුව ''පෞරුෂ :- මානුෂවාදී විග්‍රහය පිළිබඳ අධ්‍යයනයක්'' තුළින් අවධාරණය කරන්නේ මිනිසාට ආවේණික සකලවිධ ශක්තීන් උපයෝගී කරගෙන චින්තනය, බුද්ධිය මත පදනම්ව ජීවිතයේ ගැටලු විසඳා ගනිමින් ආත්ම සාක්ෂාත්කරණය කරගැනීමේ ක්‍රමවේදයක් පිළිබඳ අධ්‍යයනයකි. මෙම

පර්යේෂණය තුළින් මාගේ මාතෘකාවට අදාළව පෞරුෂය, මානුෂවාදී දර්ශනය සහ මානුෂවාදී මනෝවිද්‍යාව පෞරුෂය හා සම්බන්ධ වන ආකාරයත් අධ්‍යයනය කෙරෙයි.

**අරමුණු**

**මූලික අරමුණ**

පෞරුෂය සම්බන්ධයෙනුත්, මානුෂවාදය, මානුෂවාදී මනෝවිද්‍යාව යන ක්ෂේත්‍ර සම්බන්ධයෙනුත් වෙන වෙන ම බොහෝ ග්‍රන්ථ රචනා වී ඇතත් ''පෞරුෂය :- මානුෂවාදී විග්‍රහය පිළිබඳ අධ්‍යයනයක්'' යන මැයෙන් මානුෂවාදී සංකල්ප අළලා මෙතෙක් කිසිදු ග්‍රන්ථයක් සිංහල භාෂාවෙන් රචනා වී නොමැති බැවින් එම අවශ්‍යතාව සම්පූර්ණ කිරීමක් මෙහිදී මූලික වශයෙන් සිදු කෙරේ. මෙම මූලික රමුණ කරා ළඟාවීමේදී පහත අවශේෂ අරමුණු කෙරෙහි සැලකිලිමත් වේ.

**අවශේෂ අරමුණු**

1. ''පෞරුෂ මනෝවිද්‍යාව'' තුළ පෞරුෂය පිළිබඳව ඉදිරිපත්වන විවිධ නිර්වචන සහ න්‍යායයන් පිළිබඳව විමසා බැලීම.

2. මානුෂවාදී දර්ශනය සහ එහි ස්වභාවය පිළිබඳව පුළුල් ලෙස විමසා බැලීම.

3. මානුෂවාදී මනෝවිද්‍යාව සහ එහි ස්වභාවය පිළිබඳව විමසා බැලීම.

4. මානුෂවාදී මනෝවිද්‍යාඥයින් පෞරුෂය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද න්‍යායයන් පිළිබඳව විමසා බැලීම.

5. මානුෂවාදී මනෝවිද්‍යාවේ නව ප්‍රවණතා සහ එම නවතම මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයන් මගින් පුද්ගලයා සහ පුද්ගල පෞරුෂය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද මතවාද විමසා බැලීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

විශ්වකෝෂ, ශබ්දකෝෂ පරීක්ෂාව, සිංහල ඉංග්‍රීසි ග්‍රන්ථ පරිශීලනය, මාතෘකාවට අදාළ ග්‍රන්ථ අන්තර්ජාලය ඇසුරින් පරිශීලනය, අන්තර්ජාලයෙහි පවතින සඟරා සහ ලිපි පරිශීලනය තුළින් මෙම පර්යේෂණය සඳහා අදාළ දත්ත ලබා ගැනීම සිදු කෙරෙන අතර මෙම පර්යේෂණය ඉදිරිපත් කෙරෙන්නේ ''පෞරුෂය : මානුෂවාදී විග්‍රහය'' පිළිබඳ ගුණාත්මක විශ්ලේෂණයක් ලෙසිනි.

**පර්යේෂණයේ වැදගත්කම**

පෞරුෂය පිළිබඳ ඉදිරිපත් වන සිද්ධාන්ත මෙම පර්යේෂණය තුළින් විග්‍රහ කෙරේ. මානුෂවාදී දර්ශනය සහ එහි උප විෂයයන් පිළිබඳව දීර්ඝ විස්තරයක් මෙහි අන්තර්ගත කර තිබේ. මානුෂවාදී මනෝවිද්‍යාව, ඒබ්‍රහම් මාස්ලෝගේ, කාල් රොජස්ගේ පෞරුෂ සිද්ධාන්ත, මානුෂවාදී මනෝවිද්‍යාවේ පෞරුෂය සම්බන්ධයෙන් ඉදිරිපත් වන නව ප්‍රවණතා මේ තුළින් විමසීමට ලක් කෙරේ. මෙම පර්යේෂණය දර්ශනය හා මනෝවිද්‍යාව හදාරණ විද්‍යාර්ථීන්ට වඩා ප්‍රයෝජනවත් වනු ඇතැයි යනු මාගේ හැඟීම යි.

## 2. දෙ වැනි පරිච්ඡේදය

2. පෞරුෂය හැඳින්වීම

### 2. 1. පෞරුෂය නිර්වචනය කිරීම

පෞරුෂය 'Personality' යන වචනය තුළින් පුද්ගල විශේෂතාව, ආත්මභාවය, පුද්ගලත්වය, පුද්ගල ස්වභාවය යන අරුත් ගම්‍ය වේ. සරල අර්ථයෙන් මිනිසෙකුගේ චරිතය අනික් මිනිසුන්ගේ චරිතයන් හා සසඳන කල වෙනස් වී පෙනෙන විවිධ පැතිකඩ පෞරුෂය වශයෙන් හැඳින්විය හැකිය. මෙසේ පෞරුෂය සහ පුද්ගල වෙනස්කම් අධ්‍යයනය කිරීම සඳහා මනෝවිද්‍යාවේ බිහි වී ඇති විෂය ශාඛාව පෞරුෂ මනෝවිද්‍යාව (Personality Psychology) වශයෙන් හඳුන්වනු ලැබේ. පුද්ගලයකුගේ ප්‍රජානනය (Cognition), අභිප්‍රේරණය (Motivation), චර්යාවන් (Behaviors) ආදී විවිධ අංශ කෙරෙහි පෞරුෂය මගින් බලපෑමක් සිදු කරයි.

සාමාන්‍යයෙන් පොදු ව්‍යවහාරයේ දී පෞරුෂය යන්න භාවිත කරන්නේ යම් පුද්ගලයෙකුගේ සාමාන්‍ය ප්‍රතිරූපය හැඳින්වීම සඳහා ය. නිදසුනක් වශයෙන් ''සුනිල්ට භයානක පෙනුමක් සහිත පෞරුෂයක් තිබේ.'' ''නිමල්ට ක්‍රියාශීලී පෞරුෂයක් තිබේ.'' ආදී වශයෙන් පැවසීම දැක්විය හැකිය.

මෙම සාමාන්‍ය භාවිතය පෞරුෂය (Personality) යන වචනයෙහි නිරුක්තිය සිහිපත් කරයි. එනම්, පෞරුෂය (Personality) යන වචනය නිර්මාණය වී ඇත්තේ ලතින් භාෂාවේ වචනයක් වන ''පර්සොනා'' (Persona) යන්නෙනි. පුරාතන ග්‍රීක ගුරුවරයකු විසින් ප්‍රථම වරට මෙම වචනය ඇසුරු කොට තිබේ. ග්‍රීක නාට්‍යකරුවන් සිය රංගන කාර්යයන්හි නිරත වීමේ දී ඔවුන්ගේ මුහුණ ඉදිරියෙන් වෙස් මුහුණක් පැළඳ තිබේ. මේ මුහුණ අතරින් ඔවුන් කතා කළ නිසා ''පර්සොනා'' (Persona) යන වචනය භාවිත විය. මෙහි අදහස වන්නේ *තමන් අන්‍යයන්ට පෙනෙන ආකාරය* යි. මෙම නිර්වචනයෙන් සලකා ඇත්තේ පුද්ගල ස්වභාවය හා බාහිර පෙනුම පමණි. එමගින් පෞරුෂයේ සංවිධානාත්මක රටාව හා ව්‍යුහාත්මක කරුණු විග්‍රහ වන්නේ නැත. ග්‍රීක නාට්‍යය සඳහා සහභාගි වූ රංගන ශිල්පීන්ට වැඩි වශයෙන් භූමිකා රාශියක් රඟ දැක්වීමට සිදුවිය. ඒ අනුව රංගන ශිල්පීහු විවිධ භූමිකා අභ්‍යුපගමනය (ආරෝපණය) කරන බව ප්‍රේක්ෂකයන්ට පෙන්වීම සඳහා එකකට එකක් වෙනස්වෙස්මුහුණු පළඳිති.[1]